54648

AL/2021(2022)/22/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021 (2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021 (2022)

භූගෝල විද්‍යාව I
புவியியல் I
Geography I

22 S I

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

විභාග අංකය : ................................

**උපදෙස්:**

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **තුනකින්** සමන්විත වේ. I කොටස බහුවරණ ප්‍රශ්න **40** කින් සමන්විත වන අතර, ඒවාට පිළිතුරු **මෙම පත්‍රයේ ම** සැපයිය යුතු ය.
- I කොටසේ නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු **එක** බැගින් හිමිවේ.
- II කොටසෙහි ප්‍රශ්න **දෙකට ම** පිළිතුරු සැපයිය යුතු ය.
- III කොටස ප්‍රශ්න **හතරකින්** සමන්විත වන අතර තෝරාගත් ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සැපයිය යුතු ය.
- I, II සහ III කොටස්වල පිළිතුරු පත්‍ර එකට අමුණා භාර දිය යුතු ය.

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| | ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|---|
| I කොටස | 1 - 40 | |
| II කොටස | 1 | |
| | 2 | |
| III කොටස | 3 | |
| | 4 | |
| | 5 | |
| | 6 | |
| එකතුව | | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අතිරේක ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

## I කොටස

- එක් එක් ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර අඩංගු වරණය තෝරා එහි **අංකය** ප්‍රශ්නය ඉදිරියේ ඇති **තිත් ඉර මත** ලියන්න.

**1.** පහත සඳහන් වරණ අතුරෙන් තේමා සිතියම් යුගලයකට නිදසුනක් දැක්වෙන්නේ කවරක ද?
(1) රේඛාංකිත සිතියම් සහ භූ ලක්ෂණ සිතියම්
(2) කාලගුණ සිතියම් සහ ගුගල් සිතියම්
(3) භූ ලක්ෂණ සිතියම් සහ සංචාරක සිතියම්
(4) තිත් සිතියම් සහ සම සංඛ්‍යා සිතියම්
(5) භූ ලක්ෂණ සිතියම් සහ ඝනත්ව සිතියම් (......)

**2.** ශ්‍රී ලංකාවේ 1: 50 000 ඒකාබද්ධ භූ ලක්ෂණ සිතියම් පත්‍රයක් වන්නේ කවරක් ද?
(1) පදියතලාව හා අම්පාර
(2) මාතර හා තංගල්ල
(3) හොරොව්පොතාන හා ත්‍රිකුණාමලය
(4) බුත්තල හා පානම
(5) පොතුවිල් හා කෝමාරි (......)

**3.** ශ්‍රී ලංකාවේ 1: 50 000 භූ ලක්ෂණ සිතියමක අඩංගු වන සංස්කෘතික ලක්ෂණයක් හා භෞතික ලක්ෂණයක් පිළිවෙලින් දැක්වෙන වරණය කුමක් ද?

(1) මොහොර සහ වැලි වැටිය (2) වී කුඹුරු සහ ජනාවාස
(3) වාරිමාර්ග ඇල සහ ගංගාව (4) භූවිෂමතාව සහ බෑවුම
(5) මාර්ග සහ පරිපාලන මායිම් (......)

**4.** ශ්‍රී ලංකාවේ දිනක දී COVID-19 වෛරසය ආසාදනය වන සංඛ්‍යාවේ වයස් සංයුතිය නිරූපණය කිරීමට වඩාත් යෝග්‍ය ප්‍රස්තාරික ක්‍රමය කුමක් ද?

(1) සංයුක්ත රේඛා ප්‍රස්තාරය (2) විසිරි සටහන
(3) සරල රේඛා ප්‍රස්තාරය (4) සක් සටහන (පයි ප්‍රස්තාරය)
(5) බහු රේඛා ප්‍රස්තාරය (......)

**5.** දත්ත ව්‍යාප්තියක අන්තර් චාතුර්ථක පරාසය පිහිටා ඇත්තේ,

(1) ඉහළ චාතුර්ථකය හා පහළ චාතුර්ථකය අතර ය.
(2) මධ්‍යස්ථය හා පහළ චාතුර්ථකය අතර ය.
(3) මධ්‍යස්ථය හා ඉහළ චාතුර්ථකය අතර ය.
(4) උපරිම අගය හා අවම අගය අතර ය.
(5) මධ්‍යන්‍යය හා අවම අගය අතර ය. (......)

**6.** භූගෝලීය තොරතුරු පද්ධතියක අවකාශීය දත්ත සඳහා උදාහරණයක් වන්නේ,

(1) මිනිසුන් සංඛ්‍යාවයි. (2) ශාඛ වර්ගයයි.
(3) අධ්‍යාපන මට්ටමයි. (4) ළිංවල පිහිටීමයි.
(5) ජලයේ ගුණාත්මක තත්ත්වයයි. (......)

**7.** පහත දැක්වෙන වරණ අතුරෙන් සන්තතික දත්ත සඳහා උදාහරණ තුනක් දැක්වෙන්නේ කවරක ද?

(1) උස, කාලය සහ උෂ්ණත්වය
(2) බර, දුර සහ සිසුන් සංඛ්‍යාව
(3) වේලාව, වර්ෂණය සහ වැව් සංඛ්‍යාව
(4) උෂ්ණත්වය, වාෂ්පීකරණය සහ සංචාරකයින් සංඛ්‍යාව
(5) උස, වැව් සංඛ්‍යාව සහ පවුලක දරුවන් සංඛ්‍යාව (......)

**8.** ද්විතීයික දත්ත මූලාශ්‍ර තුනක් දැක්වෙන නිවැරදි වරණය කුමක් ද?

(1) ගුවන් ඡායාරූප, සම්මුඛ සාකච්ඡා සහ සිතියම්
(2) චන්ද්‍රිකා ප්‍රතිබිම්බ, ප්‍රශ්නාවලි සහ නිරීක්ෂණ
(3) සම්මුඛ සාකච්ඡා, භූ ලක්ෂණ සිතියම් සහ සමීක්ෂණ
(4) සම්මුඛ සාකච්ඡා, අන්තර්ජාලය සහ මිනුම්
(5) ගුවන් ඡායාරූප, අන්තර්ජාලය සහ සිතියම් (......)

**9.** භූගෝලීය තොරතුරු පද්ධතියේ ආදාන උපාංගයකට උදාහරණයක් දැක්වෙන වරණය කුමක් ද?

(1) සන්දර්ශකය (Monitor) (2) පරිගණකය (Computer)
(3) මුද්‍රණ යන්ත්‍රය (Printer) (4) සුපරීක්ෂකය (Scanner)
(5) ලකුණුකරණය (Plotter) (......)

**10.** 1: 50 000 භූ ලක්ෂණ සිතියමක දැක්වෙන ජලවහන ලක්ෂණ දෙකක් ඇතුළත් වරණය කුමක් ද?

(1) හැඩපලු ගංගාව හා සමමිතික බෑවුම (2) ගං ද්‍රෝණය හා අතු ගංගාව
(3) අරීය ජලවහනය හා තෙරුව (4) දිය ඇල්ල හා දළ බෑවුම
(5) වගුරුබිම හා නිම්නය (......)

**11.** වායුගෝලීය තෙතමනය මැනීම සඳහා භාවිත කරන උපකරණය වන්නේ,

(1) අනිලමානයයි. (2) උෂ්ණත්වමානයයි.
(3) ආර්ද්‍රතාමානයයි. (4) වර්ෂාමානයයි.
(5) පීඩනමානයයි. (......)

**12.** නයිස් පාෂාණයේ මව් පාෂාණය කුමක් ද?

(1) ශල්ක (2) ග්‍රැනයිට් (3) වැලිගල් (4) හුණුගල් (5) ශිෂ්ට් (......)

**13.** මතු දැක්වෙන ඒවායින් රසායනිකව සෑදී ඇති පාෂාණ යුගලය කවරේ ද?
(1) මඩ සහ මැටි (2) ජීර්ණක සහ ගල් අඟුරු
(3) ජිප්සම් සහ හෙමටයිට් (4) ලිමොනයිට් සහ අකුරු මැටි
(5) වැලි සහ ගල්කැට (......)

**14.** 'ඇල්බිඩෝව' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?
(1) පෘථිවිය විසින් අභ්‍යාවකාශයට පරාවර්තනය කරන සූර්ය විකිරණය
(2) උන්නතාංශය වැඩිවන විට උෂ්ණත්වය පහත බැසීමේ අනුපාතිකය
(3) පෘථිවි පෘෂ්ඨය මගින් අවශෝෂණය කරන සූර්ය විකිරණ ප්‍රමාණය
(4) යමහලක් විදාරණය වීමෙන් පසු ඇතිවන ධූම ස්තරය
(5) වලාකුළු ආවරණයෙන් අවශෝෂණය කරන සූර්ය විකිරණ ප්‍රමාණය (......)

**15.** සූර්ය ලප ඇතිවීමට හේතුව වන්නේ,
(1) සූර්ය විකිරණය වැඩිවීම ය.
(2) ග්‍රහක සමග ගැටීම ය.
(3) සෞරග්‍රහ මණ්ඩලයේ බලපෑම ය.
(4) සූර්යයාගේ චුම්බක ක්ෂේත්‍රයේ පිපිරීම් ය.
(5) සූර්යයා මිය යන ක්‍රියාවලිය ආරම්භ වීම ය. (......)

**16.** වැඩිම සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනයක් ලබන ශ්‍රී ලංකාවේ ගංගා පෝෂක ප්‍රදේශය කුමක් ද?
(1) කළු ගඟ (2) වලවේ ගඟ
(3) ගිං ගඟ (4) මහ ඔය
(5) මහවැලි ගඟ (......)

**17.** කඳු ග්ලැසියර් ප්‍රදේශවල ඛාදනය නිසා ඇතිවන භූ රූප තුනක් දැක්වෙන වරණය කුමක් ද?
(1) සර්ක, ලම්බ නිම්න සහ කේම
(2) U හැඩ නිම්න, පිරමිඩාකාර කුළු සහ ගිරි විල
(3) අරේට, පීත්තපටි විල් සහ එස්කර්
(4) ලම්බ නිම්න, ගිරි විල සහ හෙබ
(5) ඩ්‍රම්ලීන්, සර්ක සහ U හැඩ නිම්න (......)

**18.** 'පතන ශීඝ්‍රතාව' ලෙස හඳුන්වන්නේ,
(1) ඉහළයන උන්නතාංශය සමග උෂ්ණත්වය අඩුවීමේ ශීඝ්‍රතාවයි.
(2) ඉහළයන උන්නතාංශය සමග උෂ්ණත්වය වැඩිවීමේ ශීඝ්‍රතාවයි.
(3) වෙනස්වන අක්ෂාංශය අනුව උෂ්ණත්වය අඩුවීමේ ශීඝ්‍රතාවයි.
(4) ඝනීභවන මට්ටම දක්වා වාතය සිසිල්වීමේ ශීඝ්‍රතාවයි.
(5) පහළ බසින වාතස්කන්ධවල උෂ්ණත්වය අඩුවීමේ ශීඝ්‍රතාවයි. (......)

**19.** තෙවන සනයේ භූ රූපයකට නිදසුනක් වන්නේ කවරක් ද?
(1) සාගර ද්‍රෝණිය (2) V හැඩ නිම්නය
(3) කඳු පද්ධති (4) සාමුද්‍රික වැටිය
(5) මහාද්වීපික පළිහ (......)

**20.** සම්පීඩන බලවේග මගින් නිර්මාණය වන භූ රූප දෙකක් දැක්වෙන්නේ පහත කුමන වරණයෙහි ද?
(1) සමමිතික නැමි සහ සෝපාණ විභේදය (2) අසමමිතික නැමි සහ සාමාන්‍ය විභේදය
(3) උඩු නැමි මඩුල්ල සහ සමානති නැම්ම (4) ඔත් නැම්ම සහ සුවිභේද නිම්නය
(5) උලැඟි නැම්ම සහ සෝපාණ විභේදය (......)

**21.** කාස්ට් ප්‍රදේශයක දක්නට ලැබෙන භූ රූප යුගලයක් නිවැරදිව දැක්වෙන වරණය කුමක් ද?
(1) හිරිලිඹ සහ ගල්වන (2) ඩෝලයින් සහ දුනුවිල
(3) උවාලා සහ අරේට (4) ලැපීස් සහ සර්ක
(5) පොල්ජේ සහ උවාලා (......)

**22.** නිවර්තන මෝසම් දේශගුණය (Am) දැකිය හැකි ප්‍රදේශයක් වන්නේ,
(1) බටහිර ඉන්දීය දූපත් ය. (2) දකුණු ඇමරිකාවේ බ්‍රසීලය ය.
(3) නැගෙනහිර මැඩගස්කරය ය. (4) අප්‍රිකාවේ සියරා ලියොන් ය.
(5) අග්නිදිග ඕස්ට්‍රේලියාව ය. (......)

**23.** නිවර්තන තෘණ භූමියක් නිවැරදිව දැක්වෙන වරණය කුමක් ද?
(1) ආර්ජන්ටිනාවේ පැම්පාස් (2) රුසියාවේ ස්ටෙප්ස්
(3) අප්‍රිකාවේ සැවානා (4) උතුරු ඇමරිකාවේ ප්‍රේරිස්
(5) දකුණු අප්‍රිකාවේ වෙල්ඩ්ට් (......)

**24.** දකුණු ආසියාතික පාරිසරික සහයෝගීතා වැඩසටහන (SACEP) විසින් එහි කාර්ය සැලැස්ම සැකසීමේ දී ශ්‍රී ලංකාවට පවරා ඇති විශේෂිත විෂය පථය කුමක් ද?
(1) සංචාරක කර්මාන්තය (2) පාරිසරික බලපෑම් තක්සේරුව
(3) වෙරළ ප්‍රදේශ (4) ප්‍රජා වනවගාව
(5) කාන්තාරකරණය (......)

**25.** ගංගාවක යෞවන අවධියෙහි ලක්ෂණයක් දැක්වෙන නිවැරදි පිළිතුර වන්නේ,
(1) ජලය ගලායාමේ ප්‍රවේගය ඉහළ වීමයි. (2) බෑවුම ක්‍රමිකව අඩු වීමයි.
(3) ආංශික ඛාදනය ආරම්භ වීමයි. (4) ගංගා අනුක්‍රමණය ඉතා අඩු වීමයි.
(5) විශාල ජල ප්‍රමාණයක් රැගෙන යාමයි. (......)

**26.** වර්තමානයේ දී ලෝකයේ වැඩිම ප්‍රමාණයක් සහල් අපනයනය කරන රට කුමක් ද?
(1) වියට්නාමය (2) ඉන්දියාව (3) බංගලාදේශය (4) තායිලන්තය (5) චීනය (......)

**27.** ශ්‍රී ලංකාවේ දළ ජාතික නිෂ්පාදනයට සිදුකරන ආංශික දායකත්වය අවරෝහණ පිළිවෙලට නිවැරදිව දැක්වෙන වරණය කුමක් ද?
(1) කෘෂිකාර්මික, කාර්මික සහ සේවා (2) සේවා, කාර්මික සහ කෘෂිකාර්මික
(3) සේවා, කෘෂිකාර්මික සහ කාර්මික (4) කාර්මික, කෘෂිකාර්මික සහ සේවා
(5) කෘෂිකාර්මික, සේවා සහ කාර්මික (......)

**28.** වර්තමාන ලෝක ජනසංඛ්‍යාව ආසන්න වශයෙන්
(1) බිලියන 5.9 කි. (2) බිලියන 6.5 කි.
(3) බිලියන 7.9 කි. (4) බිලියන 8.5 කි.
(5) බිලියන 9.2 කි. (......)

**29.** ජාතිය, ආගම, වාර්ගිකත්වය, දේශපාලනය හෝ පාරිසරික ආපදා වැනි හේතු නිසා රටක් හැරයන පුද්ගලයෙකු හැඳින්වෙන නාමය වන්නේ,
(1) සංක්‍රමණිකයා ය. (2) ආගමනිකයා ය.
(3) සංගමනිකයා ය. (4) විගමනිකයා ය.
(5) සරණාගතයා ය. (......)

**30.** සංක්‍රමණයට බලපාන ඇදගැනීමේ සාධකයකට උදාහරණයක් වන්නේ,
(1) යුද්ධ තත්ත්ව නිසා රට හැරයාමයි.
(2) රටක ග්‍රාමීය ප්‍රදේශවල පවත්නා දරිද්‍රතාවයි.
(3) ග්‍රාමීය ප්‍රදේශවල ඉඩම් හිඟයයි.
(4) ආසන්න නගරයක රැකියා ඉඩප්‍රස්ථා ඇතිවීමයි.
(5) ප්‍රධාන නගරවල අධික ජනගහනයයි. (......)

**31.** නිදහසින් පසුව හඳුනාගත හැකි ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජන විද්‍යාත්මක ප්‍රවණතා දෙකක් වන්නේ,
(1) දළ මරණ අනුපාතිකය අඩුවීම සහ දළ උපත් අනුපාතිකය වැඩිවීම ය.
(2) ළදරු මරණ අනුපාතිකය වැඩිවීම සහ මාතෘ මරණ අනුපාතිකය වැඩිවීම ය.
(3) මුළු සාඵල්‍යතා අනුපාතිකය වැඩිවීම සහ දළ උපත් අනුපාතිකය අඩුවීම ය.
(4) දළ මරණ අනුපාතිකය වැඩිවීම සහ මාතෘ මරණ අනුපාතිකය වැඩිවීම ය.
(5) ළදරු මරණ අනුපාතිකය අඩුවීම සහ මුළු සාඵල්‍යතා අනුපාතිකය අඩුවීම ය. (......)

**32.** ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික වියළි කලාපීය වැව් ගම්මානයක ඇතුළත්වන ප්‍රධාන සංරචක හතර දැක්වෙන්නේ පහත කුමන වරණයෙහි ද?
(1) වී කුඹුරු, ගංගොඩ, හේන සහ කැලෑව
(2) කුඩා ගම්මානය, ග්‍රාම මධ්‍යස්ථානය, කලාප මධ්‍යස්ථානය සහ නාගරික මධ්‍යස්ථානය
(3) වී කුඹුරු, වෙළඳපොළ, වාරි ඇළ සහ පන්සල
(4) වාරි ඇළ, වී කුඹුරු, ග්‍රාමීය ජනාවාස සහ කැලෑව
(5) වී කුඹුරු, මාර්ග, වෙළඳපොළ සහ හේන (......)

**33.** හරිත විප්ලවයෙහි අවධානය යොමු වූයේ,
(1) වගා භූමි ප්‍රමාණය පුළුල් කිරීම කෙරෙහි ය.
(2) කාබනික පොහොර භාවිතය වර්ධනය කිරීම කෙරෙහි ය.
(3) සංවර්ධනය වන රටවල ආහාර ගැටළුව විසඳීම කෙරෙහි ය.
(4) කුඩා ඉඩම් විශාල වතුවලට ඒකාබද්ධ කිරීම කෙරෙහි ය.
(5) කපු වගාවෙහි අස්වැන්න වර්ධනය කිරීම කෙරෙහි ය. (……)

**34.** පිළිමතලාව සහ අම්බලන්ගොඩ යන ප්‍රදේශවල කෙරෙන ශ්‍රී ලංකාවේ ප්‍රධානතම හස්ත කර්මාන්ත දෙකක් පිළිවෙලින් දැක්වෙන වරණය කුමක් ද?
(1) ලී කැටයම් සහ කොහු නිෂ්පාදන
(2) පිත්තල භාණ්ඩ සහ වෙස් මුහුණු
(3) ලී කැටයම් සහ මැටි භාණ්ඩ
(4) බතික් නිෂ්පාදන සහ වෙස් මුහුණු
(5) ලාක්ෂා නිෂ්පාදන සහ කොහු නිෂ්පාදන (……)

**35.** භූගෝල විද්‍යා විෂයය ක්ෂේත්‍රයෙහි අවධානය මූලිකවම යොමු වන්නේ,
(1) පෘථිවිය මතුපිට භෞතික භූ දර්ශනය කෙරෙහි ය.
(2) ලෝකයේ මානව කටයුතුවල වෙනස්කම් කෙරෙහි ය.
(3) මානව සමාජයේ සංවර්ධනය, ව්‍යූහය සහ ක්‍රියාකාරිත්වය කෙරෙහි ය.
(4) මිනිසා සහ පරිසරය අතර පවතින අන්තර් සම්බන්ධතා කෙරෙහි ය.
(5) මානව සමාජයේ නිෂ්පාදනය, පරිභෝජනය සහ ධනය හුවමාරු වීම කෙරෙහි ය. (……)

**36.** විස්තීර්ණ කෘෂිකර්මය යනුවෙන් අදහස් වන්නේ කුමක් ද?
(1) යෙදවුම් ඒකකයක නිෂ්පාදනය වැඩිකිරීම
(2) වගාවට යොදා ගැනෙන භූමි ප්‍රමාණය වැඩිකිරීම
(3) සාම්ප්‍රදායික බෝග විවිධත්වය ප්‍රචලිත කිරීම
(4) කාබනික පොහොර භාවිතය වැඩි කිරීම
(5) වගාවන් සඳහා දේශීය දැනුම භාවිත කිරීම (……)

**37.** පහත දැක්වෙන වරණ අතුරෙන් කාබනික ගොවිතැනට වඩාත්ම යෝග්‍ය ප්‍රකාශය කුමක් ද?
(1) එය කෘෂි රසායන, පොහොර සහ කෘමිනාශක මත විශාල ලෙස රඳා පවතී.
(2) බහු ජාතික සමාගම් කාබනික ගොවිතැනට සහයෝගය ලබා දෙයි.
(3) එය හරිත විප්ලවයෙහි අත්‍යවශ්‍ය සාධකයකි.
(4) එය ගොවිතැනට ජාන තාක්ෂණය භාවිත කිරීමේ ක්‍රමයකි.
(5) එය පසේ ගුණාත්මකභාවය සහ ජනතාවගේ සෞඛ්‍යය රැක ගැනීම සහතික කරයි. (……)

**38.** ශ්‍රී ලංකාවේ සිමෙන්ති කර්මාන්තය පිහිටා ඇති ස්ථාන තුනක් දැක්වෙන්නේ පහත කුමන වරණයෙහි ද?
(1) පුත්තලම, ගාල්ල, ත්‍රිකුණාමලය
(2) ත්‍රිකුණාමලය, ඒකල, කන්තලේ
(3) ගාල්ල, පරන්තන්, එප්පාවල
(4) කන්කසන්තුරේ, ගාල්ල, පරන්තන්
(5) පැල්වත්ත, ඇඹිලිපිටිය, පුත්තලම (……)

**39.** ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය විසින් නම් කර ඇති ප්‍රධාන සංචාරක කලාප තුනක් දැක්වෙන්නේ පහත කුමන වරණයෙහි ද?
(1) කොළඹ නගරය, දකුණු වෙරළ, පුරාතන නගර
(2) නැගෙනහිර වෙරළ, සබරගමුව, වයඹ
(3) දකුණු වෙරළ, හික්කඩුව, කල්පිටිය
(4) උතුරු ප්‍රදේශය, කුමන, පාසිකුඩා
(5) ත්‍රිකුණාමලය, මඩු ප්‍රදේශය, පරෙවි දූපත (……)

**40.** ගොවීන්ට සිය කෘෂි නිෂ්පාදන අලෙවිකර ගැනීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් පිහිටුවා ඇති විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන තුනක් වන්නේ,
(1) වැලිසර, සීතාවක සහ ගොඩකවෙල ය.
(2) ඒකල, රත්මලාන සහ හම්බන්තොට ය.
(3) මීගොඩ, තඹුත්තේගම සහ කැප්පෙටිපොල ය.
(4) දඹුල්ල, කොග්ගල සහ බියගම ය.
(5) මරඳගහමුල, නුවරඑළිය සහ පල්ලෙකැලේ ය. (……)

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கை பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021 (2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021 (2022)

ප්‍රශ්න අංකය / வினா இல. / Question No. 2


භූගෝල විද්‍යාව I / புவியியல் I / Geography I

II කොටස / பகுதி II / PART II

22 STE I

විභාග අංකය / சுட்டெண் / Index No ..............................






SCALE 1 : 50,000

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021(2022)
General Certificate of Education (Adv. Level) Examination, 2021(2022)

භූගෝල විද්‍යාව I
புவியியல் I
Geography I

22 S I

**උපදෙස්:**

* **II** කොටසෙහි ප්‍රශ්න **දෙකට ම** පිළිතුරු සැපයිය යුතු ය.
* **III** කොටස ප්‍රශ්න **හතරකින්** සමන්විත වන අතර ඉන් තෝරාගත් ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සැපයිය යුතු ය.
* මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම සඳහා 1:50 000 භූ ලක්ෂණ සිතියමක කොටසක් ද, ලෝක ආකෘති සිතියමක් ද, ප්‍රස්තාර කඩදාසි ද, ඩ්‍රෝයින් කඩදාසි ද සපයනු ලැබේ.

## II කොටස

**1.** ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද 1:50 000 පරිමාණයේ බිබිලේ භූ ලක්ෂණ සිතියමෙන් කොටසක් ඔබට සපයා ඇත. එම සිතියම පදනම් කරගනිමින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**සැලකිය යුතුයි:**

* **ප්‍රශ්නයට අදාළ අංකය** සහ අදාළ **උප කොටස්වල අංකය** පිළිතුරු පත්‍රයේ පැහැදිලි ව සඳහන් කළ යුතු ය.
* **පිළිතුරු භූ ලක්ෂණ සිතියමෙහි ලිවිය යුතු නො වේ.**
* සපයා ඇති භූ ලක්ෂණ සිතියම ඔබේ පිළිතුරු පත්‍රයට ඇමිණිය යුතු **නො වේ**.

(i) Ⓐ - Ⓑ රේඛාවෙන් දක්වා ඇති භෞතික ලක්ෂණය නම් කරන්න. (ලකුණු 01 යි)

(ii) Ⓒ චතුරස්‍රයේ දක්වා ඇති පරිපාලන මායිම හා Ⓓ චතුරස්‍රයේ දක්වා ඇති ජනාවාස රටාව නම් කරන්න. (ලකුණු 02 යි)

(iii) Ⓔ - Ⓕ, Ⓖ - Ⓗ, Ⓙ - Ⓚ සහ Ⓛ - Ⓜ රේඛාවලින් දක්වා ඇති භූරූප **හතර** නම් කරන්න. (ලකුණු 02 යි)

(iv) Ⓝ චතුරස්‍රයේ පිහිටා ඇති සේවා සපයන ආයතන **හතරක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(v) Ⓟ චතුරස්‍රය තුළ පිහිටා ඇති ලක්ෂණ 1:25 000 පරිමාණයෙන් නැවත ඇඳ දක්වන්න (මේ සඳහා ඩ්‍රෝයින් කඩදාසියක් ලබා ගන්න). (ලකුණු 03 යි)

(vi) සිතියම් ප්‍රදේශයේ ව්‍යාප්තව පවතින වී වගාව කෙරෙහි බලපා ඇති භෞතික සාධක **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(vii) සිතියම් ප්‍රදේශයේ වයඹ දිග කාර්තුවේ මානව කටයුතු **සීමා** කරන සාධක **හතරක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**2.** සම්මත සංකේත හා වර්ණ යොදා ගනිමින් මතු සඳහන් දෑ සපයා ඇති ලෝක ආකෘති සිතියමෙහි **ලකුණු කර නම් කරන්න.**

(i) ඩ්‍රැකන්ස්බර්ග් කඳු
(ii) ටියෙරා ඩෙල් ෆියුගෝ දූපත
(iii) ගෝබි කාන්තාරය
(iv) මිචිගන් විල
(v) ජිබ්‍රෝල්ටාර් සමුද්‍ර සන්ධිය
(vi) හඩ්සන් බොක්ක
(vii) ඩවුන්ස් තෘණ භූමිය
(viii) අයිස්ලන්තය
(ix) ලෝකයේ දිගම ගංගාව
(x) යුනෙස්කෝ (UNESCO) සංවිධානයේ ප්‍රධාන කාර්යාලය පිහිටි නගරය

(ලකුණු 10 යි)

[හත්වැනි පිටුව බලන්න.

## III කොටස

**3.** වගුව **1** හි දක්වා ඇති දත්ත ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

වගුව **1 :** ශ්‍රී ලංකාවේ තෝරාගත් දිස්ත්‍රික්ක කිහිපයක යල කන්නයේ වී අස්වැන්න - 2020

| දිස්ත්‍රික්කය | සාමාන්‍ය වී අස්වැන්න (kg/ha) |
|---|---|
| කොළඹ | 3281 |
| ගම්පහ | 3445 |
| මාතර | 3573 |
| කෑගල්ල | 3731 |
| මහනුවර | 4099 |
| මඩකලපුව | 4582 |
| බදුල්ල | 4973 |
| මාතලේ | 5030 |
| වවුනියාව | 5520 |
| හම්බන්තොට | 5986 |

මූලාශ්‍රය : ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව, 2020

(i) වගුව **1** හි දී ඇති දත්ත පදනම් කර ගනිමින් (a) මධ්‍යන්‍යය (b) දී ඇති දිස්ත්‍රික්කවල අපගමනය සහ (c) මධ්‍යන්‍ය අපගමනය ගණනය කරන්න. (ලකුණු 04 යි)

(ii) ඔබ විසින් ඉහත 3(i) හි ගණනය කළ දත්ත භාවිත කරමින් අපගමන ප්‍රස්තාරයක් අඳින්න. (මෙම අභ්‍යාසය සඳහා ප්‍රස්තාර කඩදාසියක් ලබාගන්න). (ලකුණු 05 යි)

(iii) ඉහත 3(ii) හි ඔබ විසින් අඳින ලද ප්‍රස්තාරය පදනම් කරගෙන දිස්ත්‍රික්කවල හෙක්ටයාරයකට සාමාන්‍ය වී අස්වැන්නෙහි කැපීපෙනෙන ලක්ෂණ **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

**4.** (i) ශ්‍රී ලංකාවේ 1:50 000 භූ ලක්ෂණ සිතියමක ජාතික ඛණ්ඩාංක පද්ධතිය තීරණය කර ඇත්තේ කෙසේදැයි කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03 යි)

(ii) භූගෝලීය තොරතුරු පද්ධතියක අවකාශීය දත්ත හා අවකාශීය නොවන දත්ත වශයෙන් අදහස් කරන්නේ කුමක් දැයි පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iii) දූරස්ථ සංවේද ක්‍රමවේද වශයෙන් ගුවන් ඡායාරූප හා චන්ද්‍රිකා ප්‍රතිබිම්බ අතර වෙනස්කම් **දෙකක්** සංසන්දනාත්මකව දක්වන්න. (ලකුණු 04 යි)

(iv) ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයෙකුට සිතියමක් ප්‍රයෝජනවත් වන අයුරු උදාහරණ **හතරක්** ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

**5.** (i) දත්ත රැස්කිරීමේ ක්‍රමයක් වශයෙන් සම්මුඛ සාකච්ඡාවල ප්‍රයෝජන **දෙකක්** දක්වන්න. (ලකුණු 02 යි)

(ii) තොරතුරු ඉදිරිපත් කිරීම සඳහා ප්‍රායෝගික භූගෝල විද්‍යාවේ දී භාවිත ක්‍රමශිල්ප **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි)

(iii) ඉහත 5(ii) හි ඔබ විසින් සඳහන් කරන ලද ක්‍රමශිල්ප **දෙකක්** තෝරාගෙන ඒවායේ ප්‍රයෝජන **දෙක** බැගින් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iv) ආපදා කළමනාකරණයේ දී ප්‍රායෝගික භූගෝල විද්‍යාත්මක ක්‍රමශිල්පවල වැදගත්කම නිදසුන් **තුනක්** ඇසුරින් කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

**6.** වගුව **2** හි දක්වා ඇති දත්ත භාවිත කරමින් මතු සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

වගුව **2 :** ශ්‍රී ලංකාවේ වයස් කාණ්ඩ හා පුම්තිරිබව අනුව ඇස්තමේන්තු කරන ලද මධ්‍ය වාර්ෂික ජනසංඛ්‍යාව - 2019 (දහස් ගණන්වලින්)

| **වයස් කාණ්ඩය** | **පුරුෂ** | **ස්ත්‍රී** | **මුළු ජනසංඛ්‍යාව** |
|---|---|---|---|
| 0 - 9 | 1889 | 1 856 | 3 745 |
| 10 - 19 | 1 374 | 1 754 | 3 128 |
| 20 - 29 | 1 591 | 1 714 | 3 305 |
| 30 - 39 | 1 588 | 1 676 | 3 264 |
| 40 - 49 | 1 370 | 1 462 | 2 832 |
| 50 - 59 | 1 158 | 1 286 | 2 444 |
| 60 - 69 | 758 | 899 | 1 657 |
| >70 | 424 | 610 | 1 034 |

මූලාශ්‍රය: රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව, 2020

(i) වගුව **2** හි දක්වා ඇති 2019 වර්ෂයේ ශ්‍රී ලංකාවේ ජනසංඛ්‍යාවේ වයස් සහ පුම්තිරි ව්‍යූහය දැක්වීම සඳහා පිරමීඩ ප්‍රස්තාරයක් අඳින්න. (ලකුණු 08 යි)

(ii) ඉහත 6 (i) හි නිර්මාණය කරන ලද ප්‍රස්තාරය ඇසුරින් වයස් සහ පුම්තිරිබව අනුව ශ්‍රී ලංකාවේ ජනසංඛ්‍යාවේ කැපී පෙනෙන ලක්ෂණ **හතරක්** සාකච්ඡා කරන්න. (ලකුණු 04 යි)

(iii) සිතියම් විද්‍යාත්මක ක්‍රමයක් වශයෙන් පිරමීඩ ප්‍රස්තාරයේ වාසි **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 03 යි)

* * *

54648

AL/2021(2022)/22/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2021(2022)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2021 (2022)**
**General Certificate of Education (Adv. Level) Examination, 2021 (2022)**

**භූගෝල විද්‍යාව II**
**புவியியல் II**
**Geography II**

**22 S II**

*පැය තුනයි*
*மூன்று மணித்தியாலம்*
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස් :**
* එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්වත්** තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස - භෞතික භූගෝල විද්‍යාව

**1.** (i) පද්ධතියක් ලෙස අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

(ii) ජෛව ගෝලයේ ගතිලක්ෂණ **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) ජෛව ගෝලයේ වැදගත්කම සාධක **තුනක්** ඇසුරෙන් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iv) ජෛව ගෝලය කෙරෙහි අහිතකර ලෙස බලපාන මානව ක්‍රියාකාරකම් **තුනක්** පරීක්ෂා කරන්න. (ලකුණු 06 යි)

**2.** (i) සාගර තරංග ආශ්‍රිතව ඛාදනය සිදුවන ක්‍රම **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) සාගර තරංග නිසා වෙරළබඩ ප්‍රදේශවල නිර්මාණය වන ඛාදිත භූරූප **තුනක්** සුදුසු රූපසටහන් ඇසුරින් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) පහත දැක්වෙන වෙරළබඩ නිධිසාධිත භූරූප **දෙක** රූපසටහන් මගින් දක්වා ඒවායේ භෞතික ලක්ෂණ පැහැදිලි කරන්න.

(a) ටොම්බෝලෝව

(b) වැලි තුඩ (දිවක) (ලකුණු 06 යි)

(iv) වෙරළබඩ පරිසරය ආරක්ෂා කිරීමට ශ්‍රී ලංකා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ගෙන ඇති පියවර **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**3.** (i) ජල සම්පත් අධි භාවිතය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

(ii) ජල සම්පත් අධි භාවිතය සිදුවන ක්ෂේත්‍ර **තුනක්** කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

(iii) ජල සම්පත් අධි භාවිතය වැළැක්වීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iv) ශ්‍රී ලංකාවේ ජල සම්පත් දූෂණය වීම වැළැක්වීම සඳහා ගතහැකි පියවර **තුනක්** සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

**4.** (i) 'හරිතාගාර ආවරණය' යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

(ii) ගෝලීය උෂ්ණත්ව වෙනස්වීම් කෙරෙහි හේතුවන මානවජන්‍ය සාධක **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

## II කොටස - මානුෂ භූගෝල විද්‍යාව

**5.** 1950 සිට 2030 දක්වා කාල පරිච්ඡේද තුළ ලෝකයේ නාගරීකරණය පිළිබඳ දත්ත (නාගරික ජනසංඛ්‍යා ප්‍රතිශතය) **වගුව 1** හි දක්වා ඇත.

වගුව **1**: ප්‍රධාන කලාප අනුව ලෝකයේ නාගරීකරණය (1950 – 2030)

| කලාපය | වර්ෂය | | | | |
|---|---|---|---|---|---|
| | **1950** | **1970** | **1990** | **2010** | **2030*** |
| අප්‍රිකාව | 14.3 | 22.6 | 31.5 | 38.9 | 48.4 |
| ආසියාව | 17.5 | 23.7 | 32.3 | 44.8 | 56.7 |
| යුරෝපය | 51.7 | 63.1 | 69.9 | 72.9 | 77.5 |
| ලතින් ඇමෙරිකාව සහ කැරිබියන් | 41.3 | 57.3 | 70.7 | 78.6 | 83.6 |
| උතුරු ඇමෙරිකාව | 63.9 | 73.8 | 75.4 | 80.8 | 84.7 |
| ඕෂනියාව | 62.5 | 70.2 | 70.3 | 68.1 | 68.9 |
| වඩා දියුණු රටවල් | 54.8 | 66.8 | 72.4 | 77.2 | 81.4 |
| අඩු දියුණු රටවල් | 17.7 | 25.3 | 34.9 | 46.1 | 56.7 |
| ලෝකය | 29.6 | 36.6 | 43.0 | 51.7 | 60.4 |

* ප්‍රක්ෂේපිත

මූලාශ්‍රය : United Nations,World Urbanization Prospects - (2018 Revision)

(i) රටක නාගරීකරණ මට්ටම යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

(ii) වගුව **1** හි දක්වා ඇති දත්තවලින් හෙළිවන නාගරීකරණයෙහි ඕනෑම ගතිලක්ෂණ **හතරක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) රටක නාගරීකරණ මට්ටම කෙරෙහි බලපාන සාධක **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iv) නාගරීකරණයෙහි හිතකර බලපෑම් **තුනක්** පරීක්ෂා කරන්න. (ලකුණු 06 යි)

**6.** (i) ජනසංඛ්‍යාව වියපත්වීම යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

(ii) ජනසංඛ්‍යාව වියපත්වීමට හේතුවන ප්‍රධාන සාධක **දෙකක්** සාකච්ඡා කරන්න. (ලකුණු 04 යි)

(iii) ජනසංඛ්‍යාව වියපත්වීම රටක ආර්ථිකය කෙරෙහි ඇති කරන බලපෑම් **තුනක්** උදාහරණ සහිතව පරීක්ෂා කරන්න. (ලකුණු 06 යි)

(iv) ජනසංඛ්‍යාව වියපත්වීම නිසා ඇතිවන ගැටළු විසඳීමට ගත හැකි ක්‍රියාමාර්ග **හතරක්** කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 08 යි)

**7.** (i) නිෂ්පාදන කර්මාන්ත යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

(ii) නිෂ්පාදන කර්මාන්තවල පිහිටීම කෙරෙහි ප්‍රවාහනයේ බලපෑම සාධක **තුනක්** ඇසුරෙන් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික හස්ත කර්මාන්තයෙහි කැපී පෙනෙන ලක්ෂණ **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iv) ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට නිෂ්පාදන කර්මාන්ත දායක වන ආකාර **තුනක්** පරීක්ෂා කරන්න. (ලකුණු 06 යි)

**8.** (i) ගෝලීයකරණයේ අංග **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)